02.10.2023

සභාපති
ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල් භාරකාර මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ 01

මහත්මියණි

<u>**අර්ථසාධක අරමුදල සඳහා වාර්ෂික ප්‍රතිලාභ ගෙවීම**</u>

2023.08.07 දින උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත ඉදිරිපත් කරන ලද ලිපිය හා බැඳේ.

එමඟින්, ශ්‍රී ලංකා මහ බැංකු සේවක අර්ථසාධක අරමුදල දේශීය ණය ප්‍රශස්තකරන ක්‍රියාවලියට යොදාගැනීම සම්බන්ධයෙන් අප වෘත්තීය සංගම්, ශ්‍රී ලංකා මහ බැංකු සේවක අර්ථසාධක අරමුදල් භාරකාර මණ්ඩලය වෙත සිය විරෝධය ප්‍රකාශ කරන ලදී. එමෙන්ම, එම ක්‍රියාවලියට දායක නොවන්නේනම් අරමුදලේ වාර්ෂික ආදායම මත 30% බදු පැනවීම එම අරමුදලේ සැබෑ හිමිකරුවන්ට කරනු ලබන තර්ජනයක් බව අපගේ අදහස වන බව කළමණාකාරීත්වය සමග කරන ලද සාකච්ඡාවේ දී පැහැදිලි කරන ලදී.

ඉහත සඳහන් කරන ලද ක්‍රියාමාර්ග දෙකටම විරෝධය දක්වන බව අප වෘත්තීය සමිති ප්‍රකාශ කර තිබියදීම, ශ්‍රී ලංකා මහ බැංකුව සිය සේවා නියුක්තිකයන් සතු අර්ථසාධක අරමුදල දේශීය ණය ප්‍රශස්තකරන ක්‍රියාවලිය සඳහා බලහත්කාරයෙන් යොදාගෙන ඇත.

මේ සම්බන්ධයෙන් අපගේ දැඩි අප්‍රසාදය පළකරන අතර, මෙම ක්‍රියාවලිය මගින් සාමාජිකයන්ට සිදුවන ආර්ථික අලාභය සම්බන්ධයෙන් පුළුල්ව දැනුවත් කිරීමට සහ සමාජ ආරක්ෂණ අරමුදල් මෙම ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට විරුද්ධ සියළු සංවිධාන සමඟ ඒකාබද්ධව ක්‍රියාමාර්ග ගැනීමට අප සූදානම් බව වැඩි දුරටත් දන්වා සිටිමු.

මීට
විශ්වාසී

සභාපති
මහ බැංකු සේවක සංගමය

ලේකම්
මහ බැංකු උපාධිධාරී සංගමය

සභාපති
මහ බැංකු වෘතිකයන්ගේ සන්ධාන සහයෝගීතා සංගමය

සභාපති
මහ බැංකු ජාතික පොදු සේවක සංගමය

ලේකම්
ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමය

පිටපත් : - අධිපති / ශ්‍රී ලංකා මහ බැංකුව
ලේකම් / පාලක මණ්ඩලය